**1.** **තනතුර - අරක්කැමි**

**2.** **වයස** - අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3.** **සුදුසුකම්**

අ. **බාහිර අයදුම්කරුවන්**

i. අරක්කැමි තනතුරෙහි කාර්භාරයට අදාළව අරක්කැම් ක්ෂේත්‍රයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමක නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

ආ. **අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් සුදුසුකම් වලින් 2න් එකක් සපුරා තිබිය යුතුය)**

i. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාල වේ.

ii. අරක්කැමි ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්භාරයට අනුකූල වන වෘත්තීය පරීක්ෂණයක (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටම නොඅඩු මට්මක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL1) සේවා ගණයක සේවකයින්

ඇ. **වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4.** **වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - PL 2- 2025

මූලික වැටුප - රු. 40,008.00 (2026), රු. 42,300.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 40,008.00+17800.00 x 12 = රු. 693,696.00 (2026)

42,300.00 +17800.00 x 12 = රු. 721,200.00 (2027)

**5.** **රාජකාරී ස්වභාවය**

i. පුනරුත්ථාපනලාභීන්ගේ හා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දෛනික ආහාර පාන පෝෂණ ගුණය රැකෙන පරිදි විවිධත්වයකින් යුක්තව සකස් කිරීම හා ආහාර සුරක්ෂිතතාවය පවත්වා ගැනීම.

ii. මුලුතැන්ගෙයි උපකරණ හා උපාංග පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිත අන්දමින් පවත්වා ගෙන යාම හා තම පෞද්ගලික පිරිසිදුතාවය/ සෞඛ්‍ය තත්ත්වය ඉතා උසස් මට්ටමින් පවත්වාගෙන යාම.

iii. පාවිච්චියට නුසුදුසු ආහාර පොත /උපකරණ පිළිබඳ වගකිව යුතු පාර්ශවයන්ව ක්ෂණිකව දැනුවත් කිරීම.

iv. ආහාර සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය / උපකරණ නිසි පරිදි ඉල්ලුම් කිරීම.

v. නාස්තිය අවම වන මට්ටමින් ආහාර පාන සැකසීම.